ජගත් මානව හිමිකම් දිනය නිමිත්තෙනි.

# විලාසම

# விலாசம்

# Vilasam

2013 දෙසැම්බර් 10

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි





# අපි දෙන්නගෙම එකම නම

රාමචන්ද්‍රන් ක්‍රිෂ්ණවේණි

ඇයගේ නම රාමයියා ක්‍රිෂ්ණවේනි, මගේ නම රාමචන්ද්‍රන් ක්‍රිෂ්ණවේනි, මගේ නංගි මුදල් එවා තිබුණා. එවිට එම ලිපිය අනිත් ක්‍රිෂ්ණවේනිට ලැබුණා. පසුව මා ලියුම ආවේ නැහැ කියා බලා සිටියා. පසුව ලිපිය අරගෙන ගොස් ගුරුවරියට භාරදීලා තිබුණා.

# අංකය අවනම්බුවක්

එම් අනිල්රාජ්

මගේ නම එම්. දුනිල්රාජ්, මම ආගරතන්නෙයි දෙමළ විද්‍යාලයේ ඉගෙනුම ලබනවා. අප ලැයිමේ අංක 15. අපට සෑමදාම ලියුම් එන්නෙ ලැයිම් අංකයටයි. උදාරණයක් ලෙස එම්.ආරුමුගම්, ලැයිම් අංක 15 යු ගෘෘප්, පස්සර යනුවෙනි. මේ විදියට තිබීම අපට අවනම්බුවක්. එනිසා අපගේ සෑම නිවසකටම අංකයක් දී තනි තනි ලිපිනයක් ලැබෙනවනම් ඉතා සතුටුයි.



pix by suresh prasanna

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

SPONSORED BY
AUSTRALIA

"විලාසම" යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව ඒකකයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

"විලාසම" ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳා ගැනීමට බෙහෙවින් අදාළ වන ප්‍රශ්න පිළිබඳ ව, අපගේ සාම හා ගැටුම් විශ්ලේෂණ වැඩසටහන හා පොදු මහජනතාව ද අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇතිකරවීමේ එක් මගකි. මෙහි අන්තර්ගත අදහස් මගින් අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නො වේ.

වැඩිදුරට විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

සංස්කාරක, "විලාසම"
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2370801/06 ෆැක්ස් 94-11-2370802 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org



# விலாசம்
# විලාසම

## වතු කම්කරු පවුල් සඳහා
## ස්ථිර ලිපිනයන් ලබාදීමේ සමාජ සත්කාරය

2013 ජූලි 17 -19

වැඩමුළුව
**පස්සර**

පරිගණක සැකැස්ම වාක්‍යා රූ  දු.ඇ. 011-2708377
ඡායාරූප සුරේෂ් ප්‍රසන්න ප්‍රනාන්දු  දු.ඇ. 072-6983982
මුද්‍රණය ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 0777-315971

### ලිපිනය අහිමි වතුකම්කරුවන්ට ස්ථිර ලිපිනයක්

මේ ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලැබුයේ පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ සහයෝගය ඇතිව ඌව ශක්ති පදනම විසින් ව්‍යාපෘතිය ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරන ලදි.

මෙයින් ප්‍රතිලාභ අත්වන පුරවැසියන් සංඛ්‍යාව 3000 කට ආසන්න වේ. අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් වශයෙන් මෙහි සාර්ථකත්වය, දීප ව්‍යාප්ත මහජන වැඩසටහනක් සඳහා පිටුබලය සපයනු ඇත.

පස්සර ප්‍රාදේශීය සභාව, පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පස්සර ප්‍රදේශයේ අදාල කොට්ඨාස වල ග්‍රාම නිලධාරිවරුන් සහ පස්සර පොලීසිය ඇතුළු ආයතන ගණනාවක් මෙහි හවුල්කාරකයන් වශයෙන් කටයුතු කර ඇත.

වතු කම්කරුවන්ට නිශ්චිත ලිපිනයක් සහතික කිරීම, එම ලිපිනයට නියමිත පරිදි සාමාන්‍ය තැපැල් ක්‍රමය යටතේ ම ලියුම් ලැබෙන්නට සැලැස්වීම මෙහි ඉලක්කයයි.



# விலாசம் විලාසම

## වැවිලි අංශයේ වතු කම්කරුවන්ගේ සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳව වූ ව්‍යාපෘතිය - 2013

ශ්‍රී ලංකාවේ ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහයෙන් ක්‍රියාත්මක වන්නකි

ලංකා තේ නම්වූ ඩොලර් කෝටි ගණනක කර්මාන්තය පණ ලැබුවේ ඔවුන්ගේ ශ්‍රමයෙනි. නමුත් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු අංශයේ කම්කරුවන් ශ්‍රී ලංකාවේ වඩාත්ම දිලිඳු හා වඩාත්ම කොන්වූ ජන කණ්ඩායම් වලින් එකකි. ලාභ ශ්‍රමය වෙතවූ තම ග්‍රහණය අතහැරීමට අකැමැතිවූ සමාජ ආර්ථික ක්‍රමයක් මගින් පෝෂණය වූ ඌව පළාතේ වතුකරයේ තත්වයන් ලංකාවේ මෑතකාලීන පශ්චාත් යුද සංවර්ධන පරිශ්‍රමයන් මගින් ඇතිවූ කිසිදු බලපෑමකින් තොරවූවාක් සේ පෙනේ. මෙම ප්‍රජාවන් කෙරෙහි වන පරිපාලනමය නොසැලකිල්ල සංකේතවත් කරන්නක් වී ඇත්තේ ඔවුනට තම නමින්වූ ලිපිනයක් පවා නොමැතිවීමයි.

බොහෝ ලයින් කාමරවලට අංකයන් පවා නොමැති අතර එකම නම ඇති වෙනත් අයෙකුට වැරදීමෙන් ලිපි බෙදාහරිනු ලැබීම නිතරම සිදුවන්නකි. යමකුට ලිපියක් ලැබේ ද නැත්ද යන්න බොහෝ විට රඳා පවතින්නේ කන්කානි (ලිපි බෙදීම ද භාරව සිටින වතු කම්කරු කණ්ඩායමක සුපවයිසර් තනතුර දරන්නා) ගේ අවංකභාවය මත හා අසල්වැසියන්ගේ හොඳ හිත (මේවා බොහෝ විට නොපවතින තත්වයන් ය) හෝ හුදු අහම්බයකිනි.

මෙම ව්‍යාපෘතිය මගින් ආමන්ත්‍රණය කරනු ලබන තවත් ප්‍රශ්නයක් වන ජාතික හැඳුනුම්පත් නොමැතිවීම බොහෝ අර්බුදකාරී තත්වයන්ට තුඩුදේ. ගමන් කිරීමේ නිදහස සීමාවීම, විවිධාකාර ගනුදෙනු සිදුකර ගැනීම දුෂ්කරවීම, සිවිල් සහ අපරාධ නඩුවලදී අවාසිදායක තත්වයන්ට ලක්වීම, අනාරක්ෂිත බව, නිල ලියකියවිලි ලබා ගැනීමේ අපහසුතාවයන් හා රැකියාවක් සොයාගැනීමේ දුෂ්කරතාවයන් යනාදිය මේවායින් කිහිපයකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය ප්‍රාදේශීය හවුල්කාර සංවිධානයක් වන ‘ඌවශක්ති පදනම’ සමඟ එක්ව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර දී මේ පිළිබඳව නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෙදිණ. මෙහි අරමුණ වූයේ තම මානව හිමිකම් නිරන්තරයෙන් උල්ලංඝනයට ලක්වන්නා වූ මෙම කොන්වූ ජන ප්‍රජාවේ ජීවිත වලට පුද්ගලයෙකු සතුවිය යුතුවූ අභිමානයෙන් බිඳක් හෝ ලබා දීමයි. පසුගිය මාස හය තුළ මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ වැවිලිකරයේ ඉතිහාසයේ පළමු වරට වතුකම්කරු පවුල් 3000කට ස්ථිර ලිපිනයන් ලබාදීමට කටයුතු යොදා ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ සංවිධානය කෙරුණු වෙනත් කටයුතු සමහරක් වූයේ ලිපි ලේඛන බෙදාහැරීම සුරක්ෂිතව සිදුකරනු වස් ප්‍රදේශ 20ක ආරක්ෂිත තැපැල් ලිපි එකතු කිරීමේ පෙට්ටි ස්ථාපිත කිරීම, ප්‍රදේශයේ වතුවල අතුරු මාර්ග 40ක් සඳහා සුදුසු නම් සාකච්ඡා කොට තෝරාගෙන නාම පුවරු සවි කිරීම යනාදියයි. ජාතික හැඳුනුම්පත් 300ක් සඳහා ඉල්ලුම්පත් යැවීමේ ක්‍රියාදාමය ඉක්මන් කරනු වස් ජංගම කාර්ය සායනයන් (එදඉසකැ ඤකසඛසපි) පැවැත්වුණු අතර එසේ නොවන්නට ඒවායෙන් බොහොමයක් අයිතිකරුවන් හට ලැබීම ප්‍රමාදවීමට හෝ නොලැබී යාමටම ඉඩකඩ තිබිණි. මෙම ක්‍රියාමාර්ගය නුදුරු අනාගතයේ දී විභාග වලට පෙනී සිටීමට නියමිත විශාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසකට විශේෂයෙන් වැදගත් වූවක් විය.

රටේ අනෙකුත් පළාත් වල සාමාන්‍ය සිදුවීමක් හා නිසැකවම සිදුවන්නක් වූ තම ලිපි හුවමාරු ආරක්ෂිත ලෙස ලැබීම මෙම පළාත් වලදී දුෂ්කරතාවයන් හා අස්ථිරතාවයන්ගෙන් ගහන ක්‍රියාදාමයක් වී ඇත. ඉතාම කලාතුරකින් සිදුවන්නක් වූ විශ්ව විද්‍යාලයකට ඇතුළු වීමේ වරම ලැබීම, කොළඹ රැකියාවක් ලැබීම, විදේශගතව සිටින තම ඥාතියකුගෙන් ඉතා හදිසියෙන් බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණයක් ලැබීම යනාදිය සිදුවන්නේ ද නැත්ද යන්න ඔවුන්ගේ ජීවිත වලට තීරණාත්මක වන අවස්ථාවන් බොහොමයකි. වතු කම්කරු ප්‍රජාවන්හි සාමාජිකයන් හට මෙම දුර්ලභ අවස්ථාවන් බොහෝ විට ලැබෙන්නේ ජීවිත කාලයටම වරක් හෝ දෙවරක් යන කරුණ මත, එය බලාපොරොත්තුව හා පසුතැවිල්ල අතර වූ වෙනසක් යයි කීවද වරදක් නොවේ.



# අනන්‍යතාවට ගරු කිරීමක්

ලයනල් ගුරුගේ
ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ ප්‍රධානී



ජාතික ආර්ථිකයට මහඟු දායකත්වයක් එක් කරමින් තේ වතු කර්මාන්තයට ජීවය පිඹින සුවිශේෂී ජන කොට්ඨාසයක් හැටියට වතු කම්කරු ප්‍රජාව බුහුමනට නිස්සෝය. එහෙත් බ්‍රිතාන්‍ය යටත් විජිතය විසින් වතු කර්මාන්තයට අවශ්‍ය ශ්‍රම බලකාය නිර්මාණය කර ගැනීමේ අරමුණින් දකුණු ඉන්දියානුවන් මෙරටට ගෙන් වූ දා පටන් වර්තමානය වන තෙක්ම ඔවුන්ගේ ජන දිවිය දුක්ඛිත තත්වයෙන් මුදවා ගැනීමේ විධිමත් වැඩ පිළිවෙළක් දියත් කිරීමට අධිරාජ්‍යවාදී පාලකයෝ මෙන්ම දේශීය පාලකයෝද අසමත් වූහ. එනිසා, ඔවුන් තවමත් ජීවත්වනුයේ සෞඛ්‍යාරක්ෂිත  වටපිටාවක් නොමැති සීමිත වපසරියක් සහිත ලැයිම් කාමරවල ය.

එම පවුල්වල දරුවන්ට ඇති අධ්‍යාපන අවස්ථා සීමා සහිත ය. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහලක් වෙත යෑම දුෂ්කර හා වෙහෙසකර ගමනකි. දෛනික වැටුප් ලබන මේ කම්කරුවන්ට සේවක අර්ථසාදක අරමුදලේ ප්‍රතිලාභ පවා අහිමි කර ඇත්තේ වතුවල ආදායම් පහළ ගොස් ඇත යන චෝදනාව නගමිනි. එහෙත් ඔවුන්ගේ වැටුපෙන් වාරික අයකර ගැනීම ද සිදුවේ.

ලංකාවේ සෑම පුරවැසියකුටම ලැබෙන තැපැල් සේවය වතු කම්කරුවන් වෙත ලැබෙනුයේ මන්දගාමීව ය. නො එසේ නම් ලැබෙන්නේ ම නැත. මේ නිසා රජයේ විභාග, සම්මුඛ පරීක්ෂණ යනාදී ඉතාමත් වැදගත් අවස්ථාවන් පවා ඔවුන්ට අහිමිව යන තත්වයක් පැන නැගී ඇත්තේ නියමිත දිනට ප්‍රමාද වී ලිපි ලැබෙන හෙයිනි. මෙය දුක්ඛිත තත්වයකි. සමාන පුරවැසියන් හැටියට පිළිගැනීම ව්‍යවස්ථාවට පමණක් සීමා කිරීමකි.

30 වසරක යුද්ධය නිමා කිරීමෙන් පසුව වත්මන් ජනාධිපතිවරයා විසින් පත්කරන ලද ප්‍රතිසන්ධාන කොමිසම 9.200 ඡේදයෙහි මෙසේ කරුණු දක්වයි.

වතු ප්‍රදේශවල අධ්‍යාපන, සෞඛ්‍ය ගැටලු සහ ජීවන දුෂ්කරතා ගැන ඔවුන් කොමිසමට කරුණු දක්වා ඇත. පහසුකම් සහ වඩා හොඳ ජීවන තත්වයක් ඇති කිරීමටත් ආණ්ඩුව පියවර ගත යුතු බව කොමිසම නිර්දේශ කරයි. මේ සියලු කරුණු අනුව මේ පහසුකම් ලබාදීම ජාතික යුතුකමකි. ඔවුන්ගේ අනන්‍යතාවට ගරු කිරීමකි.







# ක්‍රමවේදය

වතු කම්කරුවන්ට ලිපිනයන් සකස් කර දෙමින් ඔවුන්ට අභිමානයක් ඇති කර දීමේ යෝජනාව ඉදිරිපත් වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා ක්‍රියාකාරීත්ව ඒකකයෙනි. ඌව ශක්ති පදනම මෙය ක්‍රියාත්මක කිරීම සඳහා උපරිම සහයෝගය ලබා දෙමින් එම කටයුත්ත සම්බන්ධීකරණය කළේය. පළමු අදියරෙහි දී පස්සර ප්‍රදේශයේ වතු කොට්ඨාස ගණනාවක ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන ලදි. නිවැසියන් හමු වී සාකච්ඡා කොට ඔවුන්ගේ අදහස් උදහස්,අභිලාෂ අවබෝධ කර ගැනීමට උත්සාහ දැරීම ඵලදායක විය. ගැටලුව හඳුනා ගැනීම එහි අපේක්ෂාව විය.

ඉන් පසු පවුල් 50 කට ආසන්න පිරිසක් නියෝජනය වන පරිදි ජන කණ්ඩායම් සඳහා නායකත්වය දෙන ක්‍රියාකාරී කමිටු ගොඩ නගන ලදි. මෙසේ ගොඩ නගන ලද ක්‍රියාකාරී කමිටු 40 ක් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීම ඊළඟ අදියරේ දී ක්‍රියාත්මක විය.

වීදි සහ ලිපිනයන් හඳුනා ගැනීම සඳහා සහභාගීත්ව ක්‍රමවේදයක් අනුගමනය කිරීම ඔවුන්ට පැවරුණු වගකීමයි.

ලැයිම් හඳුන්වාදීම සඳහා එතෙක් භාවිත කරන ලද ඇතැම් නම් පුරවැසියන් කොන් වූ පිරිස් හැටියට සැලකීමට හේතු වී තිබිණ. මෙය අධ්‍යාපනය ලබන දරුවන්ගේ පසුගාමිත්වය සහ ආත්ම ගෞරවය පලුදු වීම කෙරෙහි බලපා තිබුණි.



උලු ලැයිම්, ඉලුක් ලැයිම් යනා දී ලැයිම් නම් වෙනුවට අලුත් නම් යෝජනා කෙරුණි. භාවිතයට සුදුසු එතෙක් පැවති සමහර නම් එලෙසම භාවිතයට ගැනීමට තීන්දු කෙරිණ. මෙසේ හඳුනා ගත් වීදි නාම ප්‍රදේශීය සභාව විසින් ගැසට් කරන ලදි. පස්සර තැපැල් කාර්යාලය, ප්‍රාදේශීය සභාව, පොලිසිය හා ප්‍රා.ලේ කාර්යාලය, පාසැල් සහ ග්‍රාම නිලධාරිවරුන් මෙහි දී උපරිම සහයෝග යක් ලබාදීම වැඩ පිළිවෙල කාර්යක්ෂම කිරීම කෙරෙහි බලපෑවේය. තම නිවසට අංකයක්, නිවරැදි ලිපිනයක් සහ වීදි නාමයක් හිමි වීම කලක් තිස්සේ වතු කම්කරු පවුල් මුහුණ දුන් ගැටලු සමුදාය නිරාකරණය කර ගැනීමේ එක් මගක් විය.

එ මෙන්ම මෙතෙක් හැඳුනුම් පත් අහිමි ව තිබූ 300 කට ආසන්න පිරිසක් සඳහා හැඳුනුම් පත් ලබා දීමට මැදිහත් වීම මේ වැඩපිළිවෙලේ වැදගත් පියවරකි.

වසර තුනක් ඇතුළත සියලු හැඳුනුම්පත් භාෂා තුනෙන්ම සකස් කර ලබා දීමේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ක්‍රියාත්මක වීම අනුව නව හැඳුනුම්පත් ලබා ගැනීමේ ඉමහත් බලාපොරොත්තුවෙන් ඔවුන් ජීවත්වෙති.



# කාලෝචිතයි

## පස්සර, කිතුල්ගල ඩිවිෂන් තැපැල් ස්ථානාධිපතිගේ කතාව



ක්ෂේත්‍ර නිලධාරියා විසින් ලියුම් නියමිත අයට ලබාදීමයි සිදුවන්නේ. එය අසාර්ථකයි. නියමිත අයට ලැබෙන්නේ නැහැ. ඔහු නොපැමිණියොත් ලියුම එතන තබා ගන්නවා.

ලියාපදිංචි ලිපි සඳහා නිවේදනයක් ප්‍රසිද්ධ කළත්, එය පවා ඔවුන් දකින්නේ නැහැ. එනිසා ලියාපදිංචි ලිපි දෙතුන්සීයක් නිතරම අප ළඟ ගොඩ ගැසී තිබෙනවා.

අප නැවත තැවතත් නිවේදන නිකුත් කරනවා. අප මානුෂිකත්වය සලකා ලිපි මාස ගණන් තියාගත්තට එහෙම කිරීමේ බලයක් නැහැ.

ඉන්පසු ආපසු යවනවා.

එකම නම තිබීම හා ලිපිනයක් නොමැතිවීම නිසා අප බැනුම් අහන අවස්ථාත් තිබෙනවා.

මුදල් ඇණවුම් වෙනත් අය මාරු කරගත් අවස්ථාත් තිබෙනවා.

මේ නිසා හැම කම්කරුවකුට ම තම අනන්‍යතාව තහවුරු වන පරිදි නිවැරදි ලිපියනයක් සකස් කිරීම කාලෝචිත යි.




වත්තෙන් පත් කර ඇති තැපැල් සේවකයෙක් තැපැල් මල්ල අරං යනවා. එයට විශේෂ ගාස්තුවක් ලෙස වාර්ෂිකව පොත් ගාස්තුවක් ද අය කරනවා. වත්තට එන සියලු ලිපිවල තොරතුරු සටහන් කරන්නේ ඒ පොතේ. ලියාපදිංචි ලිපි හැර සියලු ලිපි සාමාන්‍ය ලිපි මල්ලක බහා වත්තේ කළමනාකරු වෙත යවනවා.

නමුත් ලියුම් බෙදීම සතුටුදායක නැහැ. වත්තේ ප්‍රධාන කාර්යාලයේ දී මල්ල විවෘත කර ඒ ඒ ඩිවිෂන්වලට ලිපි වෙන්කරලා චෙක්රෝල ගෙනයන පුද්ගලයා අත යැව්වාම පෙරෙට්ටුවේ දී





# ළමයින්ට විශාල සහනයක් වෙයි

පී. ආරුමුගම් - විදුහල්පති
පස්සර දමිළ ජාතික පාසල



ළමයින් විශ්ව විද්‍යාලයට තෝරාගැනීම සඳහා ලිපි එනවා. රැකියා සඳහා හෝ විද්‍යා පීඨ සම්මුඛ පරීක්ෂණ ආදි ඒවාට ලිපි එනවා. මේ සඳහා ළමයින්ට ලිපි එන්නේ අනෙක් අයට වඩා පරක්කු වෙලා. මේවා වත්තේ කාර්යාලයට පියුන් කෙනෙක් ගිහිල්ල අරං එනවා. පස්සේ කාගේ අතේ හරි දීලා යවනවා. මම වත්තේ ඉන්න කාලෙත් ඒ වගේ තමයි. මම දන්න තරමින් ඒ ක්‍රමය තාමත් වෙනස් වෙලා නැහැ කියලයි මම හිතන්නෙ. එකක් තමයි වෙලාවට ලැබෙන්නැති එක, සමහර ළමයි එනවා, "සර් හෙට උදේ ඉන්ටර්විව් එකක් තියෙනවා සහතික ඕනෙ කියලා" මෑතකදි මම මාසයක් හිටියේ නැහැ. මං ආවට පස්සේ ඊළඟ දවසෙ ළමයි තිදෙනෙක් ආවා, වවුනියාවේ සඳුදා උදේ සම්මුඛ පරීක්ෂණය, ඉරිදා මෙහෙං යන්න ඕන සෙනසුරාදා හවස තමයි ලියුම් හම්බ වුණේ කියලා සෙනසුරාදා රෑ ඇවිල්ල මගෙන් සහතික ඉල්ලනවා. ඉතිං මම ක්වාටස් එකේ ඉන්න නිසා සෙනසුරාදා රෑ ඇවිල්ලා, ඒ ගොල්ලන්ට අවශ්‍ය දේවල් ලබා දීලා ඉන් පසුව ඒ ගොල්ලන් ඉරිදා ගිහින් සඳුදා සම්මුඛ සාකච්ඡාවට ගියා.



නමුත් රාත්‍රී කාලයේ මේ ළමයි මෙතනට එනකොට ත්‍රීවිල් අරගෙන සෑහෙන සල්ලි වියදම් කරගෙන තමයි මහන්සි වෙන්නෙ. මොකද රාත්‍රී කාලයට බස් නැති නිසා. ටවුමේ ඉන්න ළමයින්ට ඒ වාගේ ප්‍රශ්න නැහැ. ඒ ළමයින්ට සිකුරාදා ලියුම් ලැබිලා තියෙනවා. සිකුරාදා ඉස්කෝලේ වෙලාවේ ඒ ළමයි සහතික ටික අරගෙන ගිහිං තියෙනවා. ඉතිං මේ ළමයින්ට ඒ වාගේ නැහැ. ඒක ලොකු අසාධාරණයක්. මොණරාගල ප්‍රදේශයේ එච්චර දුර මෙහෙ ඇවිල්ල ළමයෙකුට විශ්ව විද්‍යාලයට තේරිලා ලියුමක් ඇවිල්ල තියෙනවා. ආවම ඒක හම්බවෙලා තියෙන්නෙ එයාත්තෙක්ක

# விலாசம் විලාසම






රණ්ඩු වෙච්ච වෙන පුද්ගලයෙකුට ඉතිං වත්තේ ඉන්න මහත්තුරු ඒ දෙන්නා අතර ලොකු ආරවුලක් තියෙන බව දන්නෙ නැතුව එයාට දීලා. එයා ඒක ඉරලා විසිකරලා. ඉතිං ගොඩක් කාලෙකට පස්සෙ තමයි එයා දන්නෙ මේ වගේ ලියුමක් ආපු බවත් එයා විශ්ව විද්‍යාලයට තේරිලා හිටපු බවත්. දැන් එයා ගුරුවරයෙක්. එයාගෙ නමත් ඕනෙ නම් මට කියන්න පුළුවන්. ඉතිං මේ වගේ විශ්ව විද්‍යාලයට යන්න තිබුණ වරම නැති වෙච්ච අයත් ඉන්නවා.

එක නමින්ම දෙන්නා තුන්දෙනා හතර දෙනෙක් විතර ඉන්නවා වතුවල. ඒ වගේ ලියුම් වරද්දල වෙන කෙනෙක් කඩල බලනවා. කඩල බැලුවාම තේරෙනවා මේක මට ආපු ලියුමක් නෙවෙයි කියලා, එතකොට ඒ ලියුම ගිහිල්ල හිමිකාරයට දෙන්න ගියාම එයා රණ්ඩු වෙයිද කියන බයට ඒක ඉරලා හෝ විසිකරලා දානවා. නැතිනම් ලියුම හංගලා දානවා.

රෙජිස්ටර් ලියුම් එහෙම බෙදන්නෙ නැහැ. වතුවලට ගිහිං ලියුම් බෙදන කෙනාගේ අතට (අර පියුන්ට) දෙන්නෙ නැහැ. පාර්සලුත් දෙන්නෙත් නැහැ. සාමාන්‍යයෙන් ඕඩිනරි ලිපි විතරයි පියුන්ගේ අතට දෙන්නෙ. වත්තෙ මහත්තයාගේ රෙජිස්ටර් ලෙටර් එක දෙනවා. එස්ටේට් මැනේජ්මන්ට් එකට දෙනවා. මොකද එයා එස්ටේට් මැනේජර්ගේ නියෝජිතයෙක් හැටියට නේ යන්නෙ. එතකොට රෙජිස්ටර් ලිපි, පාර්සල් එහෙම තියෙනව නම් පොඩි කොල කෑල්ලක් එවනවා, අහවල් දවසට කලිං (දවස් 3ක් හෝ 7කට කලිං වගේ නියමිත කාලයක් කියනවා) එන්න කියලා කාලයක් දෙනවා. ඒ කාලය ඇතුළත මේ අය වැඩට යන්නෙ නැතුව සල්ලි වියදම් කරගෙන ටවුමේ ගිහිල්ල ඒ රෙජිස්ටර් ලෙටර් එක අරගෙන එන්න ඕන. ඉතිං ඒකත් ලොකු පාඩුවක් වත්තේ වැඩ කරන අයට. අනිත් අයට රෙජිස්ටර් ලෙටර් එක ගිහිං ගෙදරටම දෙන කොට වතුවල ඉන්න අයට පොඩි ලියුම් කෑල්ලක් යවනවා තැපැල් කන්තෝරුවට ඇවිල්ල මේක අරගන්න කියලා. තැපැල් කන්තෝරුවට යන කොට සමහර නිලධාරීන් ඉන්නවා ඒ ලියුමත් ඕනෙ එයාගේ අයිඩෙන්ටි කාඩ් එකත් දෙකම ඕනෙ. ඒ දෙකම අරගෙන ගියොත් තමයි, ඒ ලියුම/පාර්සලය එයාගේ අතට දෙන්නෙ.






# ඔවුන්ගේ අයිතිවාසිකම් කඩ කිරීමක්

දයාලන් - ලිපි බෙදන්නාගේ කතාව

එකම ඉනිෂියල් (මුල් අකුර) ඇති 4 දෙනෙක් ඉන්නවා. ඒ 4 දෙනාගේ ලිපි බෙදන්න යන විට නිවාස අංක නැහැ. මම එකිනෙකාගෙන් විමසා බලනවා. ඒ වාගේ 4 දෙනෙකුගෙන් අහන විට, ඒ 4 දෙනා සමහර විට එයා ද, මෙයා ද යන සැකයක් මතුවෙනවා. එවැනි අවස්ථාවලදී අදාළ 4 දෙනාවම කාර්යාලයට කැඳවනවා. පසුව පෝස්ට් මාස්ටර් ඉදිරිපිට එම ලිපිය විවෘත කර, එතුමා ඉදිරිපිටදී මෙම ප්‍රශ්නය විසඳනවා. මෙය ඉතාම බරපතල අඩුපාඩුවක්. ඊට හේතුව ලිපි බෙදන මහතා ගෙදරට ඇවිත් ලබාදුන්නත් පසුව එය ස්ථිර කරගන්නට බස් ගාස්තු වියදම් කර තැපැල් ස්ථානයට ගොසින් එය ලබාගැනීමට සිදු වී තිබීමයි.

පී.රාජේන්ද්‍රන් යනුවෙන් දෙදෙනෙක් සිටිනවා. ඒ අයට සම්බන්ධ පරීක්ෂා කැඳවීම් ලිපිය භාර දීමට කාර්යාලයට කැඳවා ඒ අයගේ නඩුව විසඳා එම ලිපිය භාරදීමට පැය ගණනක් ගතවෙනවා. පසුදා පෙරවරු 10ට ඔහු යායුත්තේ අම්පාරට. ඔහු බොහෝ අපහසුතාවයට ලක්වෙනවා.



චෙක්පත් පාර්සල් බොහොමයක් විශාල වශයෙන් ලැබෙනවා. මෙවැනි නිවාස අංක නොමැතිව ඒවා භාර දීමේ අපහසුතාවයන්ට මුහුණ දෙනවා. එම චෙක්පත් සියල්ලම කාර්යාලයට භාරදීමට අපට සිදුවී තිබෙනවා. එක් පුද්ගලයකුට එන එක් චෙක්පතක් කාර්යාලයක විවෘත කර ඊ.පී.එෆ් අංකය බලා අදාළ පුද්ගලයාට එම චෙක්පත් භාරදීමට සිදුවී තිබෙනවා. මෙය බරපතල ප්‍රශ්නයක්. ආරක්ෂාව මත මේ විදියට කළත් පුද්ගලික වශයෙන් ඔවුන්ට ලැබිය යුතු අයිතිවාසිකම් කඩවී තිබෙනවා.



ඡන්ද කාඩ්පතත් ලබාදීමත් අප හරහයි සිදුවන්නෙ. අපි ඒවා වත්තේ ඇති පිල්ලෙයි මඩුවම් හා කාර්යාලය සහ පොදු ස්ථානවල තෝරා සියලුදෙනා කැඳවා එකිනෙකාට ඔවුන්ගේ නම්, ඉනිෂියල් වෙනත් ලියකියවිලි නිසි ලෙස තිබේදැයි තහවුරු කර, එය නිවැරදි නම් ඡන්ද කාඩ් එක දෙනවා.



විලාසම් විලාසම

# පැමිණිලි විභාග කිරීම පහසු කිරීමක්

මඩුල්සිම පොලිස් ස්ථානාධිපති



අනන්‍යතාවය තහවුරු කරගන්න කාටවත් නියමිත ලිපිනයක් නැහැ. ඉහළ කොටස පහළ කොටස, බී කොටස, ස්ටෝරු කොටස ඔන්න ඔය වගේ කොටස් තියෙන්නෙ. ඒ කිව්වට එක කොටසේ එකම නම් තියෙන කට්ටිය කොඩක් ඉන්නවා. එතකොට පොලිසිය පැත්තෙන් අපට ගොඩාක් වෙලාවට බීමත්ව ගහගන්නවා වාගේ පැමිණිලි එනවා. ඒ එනකොට අපට ඒ ගොල්ලන්ගේ අනන්‍යතාවය හොයාගන්න බැහැ. එහෙම පැමිණිලි ආවම මම රාළහාමිට නියෝගය දෙනවා ඔයගොල්ලො ගිහිල්ල මේ පැමිණිල්ල විභාග කරන්න කියලා. ඉතිං දැන් රාජේන්ද්‍රන් කිව්වොත් රාජේන්ද්‍රන්ල දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා. පස්සෙ ආපහු අපිට හොයන්න වෙනවා ගුටි කාපු එක්කෙන. හොයාගන්න නැත්නම් ඔයාට ගැහුවේ කවුද කියල හොයාගන්න. අහවල් තැනේ රාජේන්ද්‍රන් ගැව්වේ කිව්වම, එයාව හොයාගෙන යන්න ඕන. ඉතිං මේ විදියට වත්තේ තියෙන කොටස්වලට වෙන වෙනම අනන්‍යතාවය තහවුරු කරගත්තොත් ගොඩාක් දුරට පොලිසිය පැත්තෙන් සෑහෙන සාධාරණයක් ඉෂ්ට වෙනවා.

දවසක් පැමිණිල්ලක් ආවා. ඒක විභාග කරනකොට රාජේන්ද්‍රන්ගේ නෝනා ඇවිල්ල පැමිණිල්ලක් දානවා සිවලිංගම් ගැහුවයි කියලා, පස්සෙ ඒක විභාග කරන කොට, රාජේන්ද්‍රනුයි, එයාගේ නෝනයි, සිවලිංගමුයි ඇවිල්ල සාමදාන වුණා. පස්සෙ බලන කොට මොකද්ද වෙලා තියෙන්නෙ. පැමිණිල්ල දාපු පැමිණිලි කාරයගේ නමත් එකයි. ගහපු එක්කෙනාගේ නෝනගේ නමත් එකයි. ඉතිං මගේ මහත්තයා තමයි මේ කියලා, පොලිසියට ඇවිත් සාමදාන වුණා. පස්සෙ පැමිණිල්ල දාපු එක්කෙනා ඇවිත් අපෙන් අහනවා මම නැතුව කොහොම ද ඕගොල්ලං සාමදාන වුණේ. පැමිණිල්ලක් කොහොම ද එහේම විභාග කරන්නෙ කවුරුත් නැතුව එහෙම ඇයි කළේ සර් කියලා. පස්සෙ ආයෙත් වග උත්තර කාරයත්තෙක්කම ගිහිල්ල පැමිණිලිකාරයා හොයාගෙන ඇවිල්ල පැමිණිලි විභාග කරන්න වුණා. ඔන්න ඔය වගේ ගොඩාක් සිද්ධීන් වලට මුහුණ දෙන්න වෙනවා.

ඔය වගේ පසුගිය දිනක මම වතුකරයේ එක්කෙනෙකුට පැමිණිලිකාරයෙකුට පණිවිඩයක් යැව්වා එන්න කියලා. ඊට පස්සෙ ඒ පොලිසියෙන් මට කියල තිබුණා මේ නම තියෙන තුන්දෙනෙක් ඉන්නවා. ඒ තුන්දෙනාම බැඳලා ඉන්නෙ කියලා. එතකොට මේ ගැහැණු එක්කෙනාගේ ස්වාමි පුරුෂයා කවුද? උඩ කොටසේ රාජේන්ද්‍රන් කියනවා. උඩ කොටස කිව්වාම උඩ කොටසේ සෑහෙන පිරිස් ඉන්නවා. ඒක හොයාගෙන යනකොට රාජේන්ද්‍රන්ලා හතර පස් දෙනෙක් ඉන්නවා. එතකොට අර මනුෂ්‍යයා හොස්පිටල් එකෙන් ටිකට් කපාගෙන එනකම් අපිට ඉන්න වෙනවා, පැමිණිල්ලක් විභාග කරන්න හෝ අත් අඩංගුවට ගන්න හරි, මොකද එතකම් අපිට රාජකාරියේ විමර්ශන ඉවර කරන්න බැහැ.



# விலாசம் විලාසම

# මගේ නම තියෙන කී දෙනෙක් ඉන්නව ද?

කේ. මනිමාරන් (වතුකරයේ පදිංචිකරුවෙක්)



මනිමාරන් කියලා තව කෙනෙකුත් ඉන්නවා. ඉතිං එයාගේ ගෙදර කට්ටිය පොලීසියට පැමිණිල්ලක් දාලා තිබුණා. ඒ අවස්ථාවේ පොලීසියෙන් මනිමාරන්ව සොයාගෙන ආවා. මගේ නමත් මනිමාරන් නිසා මාවත් සොයාගෙන ආවා. එසේ එන විට බොහෝ දෙනෙකුගෙන් මනිමාරන් කවුදැයි විමසනවා. මේ විදියට කේ. මනිමාරන්ව සොයනවා. ඔහුගේ පවුලේ ප්‍රශ්නයක් නිසා අපට පැමිණිල්ලක් ලැබී ඇතැයි කියා මනිමාරන්ව සොයා එන විට, මම කන්දෙ වැඩ කරමින් සිටියා. එවිට කන්දට පොලීසිය එනවිට මගදී දෙතුන් දෙනෙකුගෙන්ම විමසා තිබෙනවා. පසුව වැඩපොළේ සියලුදෙනාම මාගෙන් විමසා සිටිය. ඔබව සොයා ආවේ පවුලේ ප්‍රශ්නයක් දැයි ද විමසුවා. ඒකට මම නැහැ කීවා. පසුව සොයා බලද්දි වෙනත් මනිමාරන් කෙනෙක් සිටිය බව දැනගන්නට ලැබුණා. මේ විදියට බොහෝ අවස්ථාවලදී මාව සොයාගෙන ඇවිත් තිබෙනවා. මාව පොලීසියට කිසිම දවසක රැගෙන ගිය නැහැ. නමුත් ගමේ සොයන කොට මට අවනම්බුවක් ඇති වෙනවා. මා ගැන බොහෝ දෙනෙක් විමසන විට, පාසැලේ ගුරුවරුන්ගෙන් විමසන විට, ඔවුන් පවුලේ ප්‍රශ්නයක් ද මොකක්ද ගැටලුව, පොලීසියෙන් ඇවිත් විමසුවා මොකක් ද වුණේ කියා අසන විට මගේ හිතට වදයක්.





# මේක ලොකු අවුලක්

මලර්වෙල්වි මහත්මිය - විදුහල්පති
බ/ආගරතැන්න දෙමළ විද්‍යාලය - පස්සර



මැයි මාසෙ තැපැල් සේවකයෙක් ඇවිල්ලා සතියක් තිස්සේ හොයලා තියනවා නමක් - ඒ කියන්නෙ හෙද විදුහලක විභාගයට ලියුමක් ඇවිල්ල. මගේ මතකෙ හැටියට මැයි 18 වගේ දිනයක පෝස්ට්මන් ඇවිල්ල මගෙන් ඇහුවා මේ නම දන්නවා ද කියලා. මම ඒ නම දන්නෙ නැහැ, මොකද එයා මේ ළඟදි කසාද බැඳලා ඇවිල්ල තියෙන්නෙ. ගමට ඇවිල්ල අවුරුදු දෙකක් විතර ඇති. ඒ නිසා මම එයාගෙ නම දන්නෙ නැහැ. ඉතිං මං කිව්වා පොඩ්ඩක් හොයල බලමු කියලා. පස්සෙ ඒ වෙලාවේ අපේ ඉස්කෝලෙ වැඩක් තිබුණා. ඒ වැඩ ටික කරමින් හිටියේ බාසුන්නැහැ. එයාත්තෙක්ක මේ පෝස්ට්මන් ගිහිල්ල කතා කරද්දි, එයා කිව්වලු අනේ ඔයාට මං කියල තියනවනෙ. මේ හෙද විදුහලේ ඇඩ්මිෂන් එකක් එයි, ඒක මගේ නෝනගේ කියල. ඉතිං අර පියුන් අහම්බෙන් වගේ බාසුන්නැහැත්තෙක්ක කතා කරපු නිසා තමයි. ලියුම එයාගේ නෝනට ආපු එකක් බව දන්නෙ.

පස්සෙ බාසුන්නැහැ ලියුම මටම ගෙනල්ල දුන්න ටීචර් මේ විභාගෙට ඇවිල්ල තියෙන්නෙ, කවදද දන්නැහැ තියෙන්නෙ කියලා. මමත් බයෙන් වගේ ලියුම කැඩුවේ මොකද සෙනසුරාදා දවසක්නෙ අදම ද දන්නැහැ විභාගෙ තියෙන්නෙ, මේ ළමයට අපරාධයක්නෙ වෙන්නෙ කියල හිතාගෙන. මං කඩල බලන කොට 11.30 විතර ඇති. හොඳ වෙලාවට ඉරිදා දවසක තමයි විභාගෙ තිබ්බේ. ඉතිං එවෙලෙම බාසුන්නැහැගේ නෝනට එන්න කියල ඇඩ්මිෂන් එක අත්සන් කරල එහෙම දුන්නා. ඉතිං ඔය වගේ සිද්ධි ගොඩක් වෙලා තියෙනවා. ඔය රට ඉඳං එන ලියුම් එහෙමත් එකම නම තියෙන නිසා මාරු වෙලා යනවා. ඒ වගේ ඒවා මං ළඟට එනවා, ඉතිං ඒවා හොයල බලලා අහවල් එක්කෙනාගේ ද කියල බලලා දීලා තියෙනවා.

මගේ නමම තියෙන තව ළමයෙක් ඉන්නවා. ඒ මගේ ශිෂ්‍යාවක්, ඒ ළමයගෙත් ලියුමක් මගේ ළඟට ආවා. ඉතිං ඒක මගේ කියල හිතල මං කැඩුවා. ඒක රත්තරන් බඩු උගස් කරපු ලිපියක්, ඉතිං මං දන්න නිසා ඒක අරයට යැව්වා.


ඉතිං අපේ ළමයි ඉගෙනගෙන ඉස්සරහට එන කාලේ ඒ ළමයින්ට වැදගත් ස්ථානයක් ලැබෙන්න ඕනෙ නම් අනිවාර්යයෙන්ම ඒගොල්ලන්ට ලිපිනයක් ඕනෙ. ඊයේ පෙරේදා මං ගිහිං කතා කරන කොට, විශ්ව විද්‍යාලයට ගිය ළමයෙකුට තමන්ගේ ලිපිනය වතුකරයේ කියල කියන්න, ලැජ්ජ හිතෙනවා. මොකද අනිත් ළමයි. ගේ නොම්බරේ කියලා, පාරෙ නම කියල පිළිවෙලකට ලිපිනය කියද්දි, මේ ළමයි නිකං වතුකරයේ කියල කියාගන්න බැරිව අපහසුතාවයට පත්වෙනවා. ඒගොල්ලන්ට ඒක හරි මදිකමක් වගේ. ඉතිං එයාලට අයිතිවාසිකමක් තියනවා, මේ රටේ ඉපදුණ අපි හැමෝටම අයිතිවාසිකමක් තියෙනවා. ඒ අයිතිවාසිකම් ලැබෙනවා. ඒ වගේම අනිවාර්යයෙන්ම ලැබෙන්න ඕන එකක් තමයි මේ ලිපිනය.





# හඳුනාගැනීමේ ගැටලුව

ආර්.එම්.සිරිසේන
ග්‍රාම නිලධාරී - පස්සර



සහතිකයක් ලියන්න යන කොට, ලැයිමේ අංකය අහනව. සමහර විට දැන් ඉන්න ළමයි ඒක දන්නෙ නැහැ. ඉස්සර ඔය අංක තිබුණා. පස්සේ ඔය ආසියානු සංවර්ධන බැංකුව එතකොට තවත් නොයෙකුත් ආයතන ඇවිල්ලා ගොඩනැගිලි හැදුවනෙ. ඒ හැදුවට පස්සෙ අංක දෙන්න බැරිවුණා. මුලින්ම හදපු කාමර වලට දීල තිබුණා. අංක එක ලයිම දෙක, ලයිම තුන, ලයිම කියල. ඔය අතර හදපු කාමර කිහිපයක් තියෙනවානෙ. කාමර ගොඩක් තියෙනව නම් සමහර වෙලාවට ඒවාට අංක නැහැ. ඉතිං ඒගොල්ලන් කියනවා. ඒඩීබී ක්වාටස් කියලා, ඉතිං ඒඩීබී ක්වාටස් මං හිතන්නෙ 25ක් විතර හදල තියෙනවා, ඉතිං එතකොට අපි කොයි ඒඩීබී ක්වාටස් එකද කියල හොයන්නෙ. ඉතිං ඇත්ත වශයෙන්ම අපි ඡන්ද හිමි නාමලේඛන වලට අපි ගෙවල් වලට ගිහිල්ල තමයි, මේ ගෙදර ඉන්නෙ අහවල් පුද්ගලය තමයි කියල හඳුනාගැනීම කරන්නෙ. ඔන්න ඔතනයි ගැටලුව.

ඊළඟට දැන් ඒ පුද්ගලයා නම් එතන ඉන්නෙ කියන එක මම දන්නවා, දැන් එයාගෙ දරුවෙක් එනවා කියමුකො සහතිකයක් ගන්න හරි, රියදුරු බලපත්‍රයක් ගන්න හරි ආවම, මං අහනවා කවුද ඔයා? එතකොට කියනවා මං අර පලනියාණ්ඩිගේ පුතා. කොයි එක්කෙනා ද? අර ඒඩීබී ක්වාටස් වල ඉන්නෙ. එතකොට මං කියනවා ඒඩීබී ක්වාටස් අර පල්ලෙහාත් තියෙනවා උඩත් තියෙනවා කොයි ක්වාටස් එක ද? අනිත් එක පලනියාණ්ඩිලා දෙන්නෙක් ඉන්නව නෙ ? මහත්තයාට මතක නැද්ද එක දවසක් අපේ ගෙදර ඇවිල්ල, ගෙදර ඉඳගෙන අර ගහ ළඟ ඉඳල ලියුම් කෑල්ලක් ලිව්වෙ... ඔන්න කියනකොට අර තාත්තද අහවල් එක්කෙනා ද කියල මතක් වෙනවා. ඉතිං අපි ඒ වගේ අපහසුතාවයට පත්වෙනවා.





# දායක වෙන්න කැමතියි

එම්.ඒ. කාදර් - සභාපති
ප්‍රාදේශීය සභාව - පස්සර



අමාත්‍යංශ ගැසට් කිරීමේ දී පළාත් පාලන ආයතන සම්බන්ධ වෙනවා. ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරල ඒවා ගැසට් කරන්න යවන්න ඕනෙ පළාත් පාලන ආයතන හරහා තමයි ඒ තැන්වලට. විශේෂයෙන්ම අපිත් දායක වෙන්න කැමතියි, සමහර විට අපි නම් කරන්නෙ අවශ්‍ය බෝඩ් වලට ප්‍රතිපාදන ඉල්ලලයි. මේ සඳහා අපිත් දායකත්වය ලබාදෙනවා බොහෝ විට. මමත් සභාවේ යම්කිසි මුදලක් ඒ බෝඩ්වලට ලබාදෙන්න සූදානම්.





# ආර්ථිකයේ ප්‍රධාන කොටස්කාරයෝ

නඩේෂන් සුරේෂ් - ඌව ශක්ති පදනමේ සභාපති

අපි අවුරුදු ගණනාවක් තිස්සේ හඳුනාගත් ගැටලුව තමයි මේ වතුකරේ ප්‍රජාවගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ අයිතිය පිළිබඳව වූ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නෙ කොහොම ද කියන එක. ඔබ කවුරුත් දන්නවා මේ රටේ ජීවත්වන ප්‍රධානම ආර්ථිකය ප්‍රධානම පුරවැසියා තමයි මේ වතුකරේ ජනතාව, වතුකර කාන්තාව. නමුත් ඒ අයගේ අනන්‍යතාවය ඒ අයගේ වාසස්ථානය තිබුණත් ඒ වාසස්ථානවලට හරි ලිපිනයක් නැති සමාජයක් හැටියටයි ඒ අය ජීවත් වෙන්නෙ. මේ ගැන කතා කරනව නම්, මේ රටේ විවිධාකාර මානව සංවර්ධන ගැන කතා කරනවා, විශේෂයෙන් මානව හිමිකම් ගැන කතා කරනවා. නමුත් අපට තවමත් බැරිවුණා මිනිසෙකුගේ අනන්‍යතාවය පිළිබඳ යම්කිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න. මං හිතන්නෙ අවුරුදු 100ක් පැරණි මෙම වාසස්ථානවල ජීවත්වන මෙම සහෝදර ජනතාව, ඒ ගොල්ලන්ට මේ හඳුනාගත් ගැටලු විසඳීම උදෙසා යම්කිසි ප්‍රයත්නයක් දරනවා. ඒ ප්‍රයත්නය තමයි මේ හැම නිවසකටම, ඔය ලයිම් කාමර කියන වචනෙ වෙනස් කරල, ඒගොල්ලන්ට නිදහසේ ජීවත්වෙන්න, තවත් කෙනෙකුට ගෞරව කළහැකි නිවසක් හැටියට ඒ නිවසට නමක්, ඒ නිවසට අංකයක්, ඒ වගේම ගෞරවානුකූලව ලිපිනයක් ලැබිලා, ඒ අයගේ නිවසටම ලිපිනයක් ලැබෙනකොට කොයිතරම් සතුටක් ද ඇති වෙන්නෙ. ඉතිං මේ තුළින් ඒ අයගේ අනන්‍යතාවය ගෞරවානුකූලව රැකගැනීමේ වැඩසටහනක් අපි ක්‍රියාත්මක කළා. ඒ වගේම ලිපිනයන් ලබාදෙන මෙම වැඩසටහන තුළ අපි






බලාපොරොත්තු වෙන්නෙ විශේෂයෙන් ප්‍රාදේශීය දේශපාලන අංශ ඒ වාගේම ප්‍රාදේශීය රාජ්‍ය සේවය සපයන ආයතන ඒ ආයතන සමග මනා සම්බන්ධතාවය ගොඩනගමින් විශේෂයෙන් පොලීසිය, තැපැල් කාර්යාලය ඒ වගේම වතු අධිකාරිය, ග්‍රාම සේවක මහත්තුරු, සිවිල් සංවිධාන මේ සියලු දෙනාම එකතු වෙලා මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම. මං හිතනවා මේ වැඩසටහන තුළින් වතුකරයේ යම්කිසි වෙනසක් ඒ වගේම මේ අයගේ ගෞරවය, විශ්වාසය ගොඩනගාගෙන බහුතර ජනතාවත්තෙක්ක සතුටින් සමගියෙන් ජීවත් වීමේ මුලපිරීමේ අවස්ථාව ලැබෙයි කියන එක තමයි අපේ බලාපොරොත්තුව.



# බොහොම සතුටුයි

වේලායුදම් පත්මනාදන් (ගම් ප්‍රධානී)
18/C/A, බිලානිවත්ත ප්‍රධාන පාර,
ගෝනකැලේ වතුයාය, පස්සර.



මේ වත්තේම අපි පරම්පරාවෙන් පරාවට පැවතෙනවා. ප්‍රධානියෙකු ලෙසත් කංකානි කැඩත් කරන අතර මෙහි පොදු සේවාවන් සහ සමාජ සේවාවන් කරගෙන ජීවත් වෙනවා. බිලානි වත්තේ ජීවත් වන අයට ස්ථිර ලිපිනයක් සාදා දීම හොඳ දෙයක් ලෙස මම දකිනවා. මෙතෙක් කල් බිලානි වත්තට එන ලිපි නැවත කාර්යාලයට යනවා. ඒ ලිපි නැවත ක්ෂේත්‍ර නිලධාරීන් පරීක්ෂාවට ලක් කරල අදාල අයට ලබා දෙනවා.ඒ වුනත් සමහර අවස්ථා වල ලිපි මාරු වෙලා යනවා.

තවමත් බිලානිවත්තට එන ලිපි ලැබෙන්නෙ බිලානිවත්ත ,සඩසිසදබ ලිපිනයට එනවා.ඒ වුනත් ඒ ලිපි හරි වෙලාවට අදාල පුද්ගලයාට ලැබෙන්නෙ බොහෝ දුෂ්කරතා මැදයි. ඌව ශක්ති ආයතනයෙන් බිලානිවත්තට සාදා දෙන අලුත් ලිපිනයන් ගැන අපි සතුටු වෙනවා. මේ ලිපිනයන් අපට ලැබෙනවා කියන්නේ බොහොම වැදගත් දෙයක්.මිනිසුන් අතර ගැටලු ඇති නොවන විදියට තැපැල් කරුට ලිපිනයන් බලල ලිපි බෙදා දෙන්න පුළුවන්.

# සහනයක්

කේ. වේනුගෝපාල්



හරි අපට බොහෝ ප්‍රශ්නවලට මුහුණුපාන්නට සිදුවී තිබෙනවා. අපට ලිපිනයක් දෙන්න පුළුවන් නම් එය ප්‍රාදේශීය සභාව මගින් හෝ ඔබගෙන් අපට සහනයක් වේ. ඒ තුළින් බොහෝ වැඩකටයුතු කරගන්නට පුළුවන්.

අප ගෙවල්වලට වත්තෙන් අංකයක් ලබාදී තිබෙනවා. නමුත් ඒවා ලියාපදිංචි වී නැහැ. මීට පෙර එම තත්වයයි තිබුණේ. නමුත් දැන් ටිකක් වෙනස්වී තිබෙනවා. ගෙවල් මට්ටමින් ලියුම් බෙදන නිසා එය වෙනස් වී නැහැ. නමුත් නිසි අංකයක් නැති නිසා සමහර ප්‍රශ්නවලට මුහුණ පානවා. අංකයක් තියෙනවා නම් හොඳයි.



# විලාසම් විලාසම

## ඵලදායකයි



මීට පෙර වත්තෙන් තැපැල් බෙදීම නිසි ලෙස සිදුවුණේ නැහැ. සමහරක් වෙලාවට පෙරට්ටුවේ දී කණක්කපුල්ලේ. ක්ෂේත්‍ර නිලධාරී විසින් අදාළ කෙනාට ලබාදෙනවා. එය දවස් හතරක් පහක් පසුවත් සිදුවෙලා තිබෙනවා. සමහර විට නොලැබෙන අවස්ථාවන් ද තියෙනවා. දැන් නමුණුකුළ අපේම ඩිවිෂන් එකක් නිසා අපේ වත්තේ සගයන් ලිපි බෙදීමේ කාර්යය කරන නිසා ඒ ප්‍රශ්නය යම් තරමක් විසඳී තිබෙනවා. නමුත් ප්‍රයිවට් කෙනෙක් දැම්මොත් ලිපිනයන් නොදන්න නිසාම බොහෝ ගැටලු මතු වෙනවා.

ගම්මානවල ප්‍රජා නායකයන් හා තරුණ පිරිස් සමඟ සාකච්ඡා කර මේ ක්‍රියාව කෙරෙනවා නම් මීට හොඳ සහයෝගයක් ලැබෙයි. හේතුව මෙය ඉතා වැදගත් කාර්යයක් නිසා. එය මට විශ්වාසයි. මෙය ක්‍රියාත්මක වෙනවා නම් අනාගත පරම්පරාවට ඵලදායී කාර්යයක් වෙයි. හේතුව ලිපිනයක් තිබීම පුද්ගලිකව හා සමාජයක් ලෙස ඉතා ගෞරවයක් ඇති කර දෙන කාරණාවක්.

මීට පෙර කාලයේ අපට තිබුණේ මාට්ටුපට්ටි ලයිම, කෝවිල් ලයිම සහ මේට්ටු ලයිම වැනි නමින්. දැන් ලයිම් වලට අංකයක් දෙනවා නම් හොඳ කාර්යයක්. විශේෂයෙන්ම දැන් ලයිම් වලට වඩා තනි ගෙවල් ඉදිවී තිබෙනවා. එය සමාජයක ගෞරවය වැඩිකර දෙන කාරණාවක්.

## නෑයන්ටත් පහසුයි

කමලේෂ්වරි



බැංකු කටයුතු, පාසැල් කටයුතු ද ළමුන්ව පාසැල්වලට ඇතුළත් කිරීමට පවා ප්‍රයෝජනවත් කාරණාවක්. මීට පෙර වත්ත විසින් මෙය සිදුවුණේ. ප්‍රශ්න තිබෙනවා. මගේ ලිපිනය ගෝනුගොල්ල ගෲප්, ලෝවර් ඩිවිෂන්, පස්සර. වත්තෙන් ලබාදුන් අංකය 10. අපට අංකයක් ලැබෙනව නම් වැදගත්.

ඒහෙම සිදු වෙනව නම් දුර ඈත නෑයෝ යහළුවන්ට ඉතා පහසුවෙන් අප සොයා එන්න පුළුවන් වෙයි.

# ජන දිවියේ සමෘද්ධිමත් භාවයට

ජී.වසන්තන්
නියෝජ්‍ය විදුහල්පති



පාසැලට තැපැල් පෙට්ටියක් ලැබීම පාසැල් ළමුන්ට පමණක් නොව ප්‍රදේශයේ මහජනතාවට ලැබුණ මහඟු අවස්ථාවක්. දෙමාපියන්ට දරුවන් අතේ එවලා තමන්ට අවශ්‍ය ලියුම් තැපැල් පෙට්ටියට දමන්න පුළුවන්. තැපැල් කාර්යාල සේවකයා දිනපතා නියමිත වේලාවට ඇවිත් ලියුම් රැගෙන යන නිසා, ලියුම් යැවීම කාර්යක්‍ෂම සිදු කෙරෙන බව විශ්වාසයි. මෙය ඔවුන්ගේ ජන දිවිය සමෘද්ධිමත් වීම කෙරෙහි නිසැක වශයෙන් ම බලපානවා.





**සී. රාජලෙච්චමි**

4/1, පූමරන්ද පුරම්

පහළ කොටස, පස්සර

දැන් අපට ලිපිනයක් තිබෙනවා. ඒ ගැන සතුටුයි.

**සෙල්ලදුරේ ජයමලර්**

බ 4/1, පූමරන්ද පුරම්

අපට අලුත් ජීවිතයක් ගැන හිතන්න අවස්ථාව ලැබුණා.

**සීතා ලෙච්චමි**

පූමරන්ද පුරම්

නිවැරදි තැපැල් සේවයක් නොතිබුණ නිසා ETF EPF ලබා ගැනීමට බාධා පැමිණි අය ඉන්නවා. මෙය විශාල ප්‍රශ්නයක් ව තිබුණා. එය විසඳා දීම ගැන සතුටුයි.



**එස්. ප්‍රියා ශිෂ්‍යාව**

වතු වගාව සඳහා ඉන්දියාවෙන් ගෙන්වන ලද ජන පිරිසෙහි හතර වැනි පරම්පරාවයි අප නියෝජනය කරන්නේ. මෙ පමණ කාලයක් ගතවීත් අතරම ගෞරවයක් ඇති ව ජීවත්වීමේ අවස්ථාව අපට ලැබී නැහැ. හේතුව අපට මනුෂ්‍යයන් හැටියට නොසැලකීමයි. කොන්වූ ජන සමාජයක් හැටියට සලකා කටයුතු කිරීමයි. මේ නිසා, පරම්පරා ගණනාවක් තිස්සේ අපේ ජනවර්ගයා මහා වේදනාවකින් පීඩා විඳිනවා. මේ වේදනාව තේරුම් ගත් සුළු පිරිසක් හෝ සිටීම ගැන අපට සතුටුයි. අපට නිවැරදි ලිපිනයන් ස්ථිර කර දෙමින් පාසැලට ද තැපැල් පෙට්ටියක් ලැබුණේ ඒ නිසයි.

ගනේෂමූර්තිට සරසවි වරම් අහිමි විය. ඊට හේතුව වතු ලැයිම්වල පදිංචිකරුවන්ට ස්ථිර ලිපිනයක් නොමැති නිසා ඇතැම් ලිපි නියමිත පරිදි නොලැබීමයි. නො එසේ නම් ප්‍රමාද වී ලැබීමයි. ”

# රාසලිංගම් ගනේෂමූර්තිගේ අනන්‍යතාව අහිමි කිරීම



ගනේෂමූර්ති, වෘත්තියෙන් ගුරුවරයෙකි. දෙමළ පියකුට දාව සිංහල මවකගේ කුසින් ඔහු උපත ලැබුවේ වතු ලැයිමක ය. මොනරාගල විපුලසේකර විදුහලෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඔහු උසස්පෙළ හැදෑරීම සඳහා පස්සර දෙමළ මහා විද්‍යාලයට ඇතුළත් වූයේ 2002 වසරේදී ය. දෙමළ භාෂාව, හින්දු සංස්කෘතිය සහ විෂයයන් දේශපාලන විද්‍යාව යන ඉගෙන ගැනීම සඳහා වෙනත් විදුහලක් නොවීම ඔහුගේ පාසැල් මාරුවට හේතුවය. දුර බැහැර සිට කලට වෙලාවට පැමිණීමට අසීරුවූයෙන් විදුහල්පතිවරයාගේ කාරුණික අතදීම අනුව ගනේෂමූර්ති සහ තවත් සිසුන් කිහිප දෙකනුට විදුහලේ ගොඩනැගිල්ලක කුඩා කාමරයක් නවාතැන් පිණිස නොමිලේ ලැබිණ. විෂයයන් තුන සඳහා **ABC** යනුවෙන් සමාර්ථ තුනක් ඔහුට ලැබිණ.

එහෙත් තමා සමග **BBC** යනුවෙන් සමාර්ථය ලැබූ සිසුවකු සරසවි වරම් ලබද්දී ගනේෂමූර්තිට සරසවි වරම් අහිමි විය. ඊට හේතුව වතු ලැයිම්වල පදිංචිකරුවන්ට ස්ථිර ලිපිනයක් නොමැති නිසා ඇතැම් ලිපි නියමිත පරිදි නොලැබීමයි. නො එසේ නම් ප්‍රමාද වී ලැබීමය. ගනේෂමූර්තිගේ ලිපිය අස්ථානගත වීම නිසා ඔහුට සරසවි වරම් අහිමි විය.

ඔවුන් ගත කළේ දුක්ඛිත දිවියකි. පවුලේ වැඩිමලා හෙයින් නංගිලා මල්ලිලාගේ අනාගතය යහමඟට ගැනීමේ වගකීම ද ඔහු උර මත වැටිණ.

"කොළඹ කේසර් වීදියේ කඩේක කාලයක් වැඩකළා. මගේ යාලුවා විශ්ව විද්‍යාල උපාධි ලබා ගත්තා. මම විවිධ රැකියාවල යෙදුණා. ඔය අතරෙදි ඌව පළාත් සභාවෙන් ගුරු පත්වීම් ගැසට් කරලා තිබුණා. මම ඉල්ලුම් පත්‍ර දැම්මා. ඒ අනුව මට ගුරුපත්වීම ලැබුණා. බාහිර උපාධියට ඉගෙන ගෙන එයින් සමත්වුණා."

ගනේෂමූර්ති තමාට සිදුවූ බේදවාචකයෙන් කම්පාවට පත් නොවී ජීවිතයට මුහුණදුන්නේ ය.

"මගේ ඉරණමට ගොදුරුවූ තවත් අය ඉන්නවා. සම්මුඛ පරීක්ෂණයකට ලැබුණ ලියුම නොලැබුණ නිසා රැකියාව අහිමි වූ අය. බැංකුවෙන් එවූ ලියුම් නොලැබුණු නිසා, කණ කර උගසට සින්න වූ අය, විභාග ප්‍රවේශ පත්‍රය නොලැබීම සහ විභාග නොලියූ අය, අර්ථසාධක අරමුදල් නොලැබුණු අය මේ අය අතර ඉන්නවා. මේක සමස්ත වතු ජනතාවට ම බලගත ගැටලුවක්." ගනේෂමූර්ති පවසයි.

ඕනෑම ගොඩනැගිල්ලකට පරිපාලන අංකයන් සහිත ලිපිනයක් තිබීම ලොව පිළිගත් ප්‍රතිපත්තියයි. ගොඩනැගිල්ලේ පදංචිකරුවන්ගේ ස්ථිර පදිංචිය සනාථ කෙරෙනුයේ එම ලිපිනයෙනි. වතු දෙමළ ජනතාව හැර රටේ හැම පුරවැසියකුට ම මේ අයිතිවාසිකම හිමිය. මානව සංවර්ධනය සහ මානව හිමිකම් පිළිබඳව උදාරම් බසින් කතා කරන ජනමත ප්‍රධානීන් හෝ ආයතන විසින් මුළුමණින් ම නොසලකා හරින ලද ප්‍රශ්නයකි මෙය.

මෙරට ජනගහනයෙන් 7% ක් පමණ වන වතු දෙමළ ජනතාව තවමත් අර්ධ වහලුන් සේ තබා ගැනීම පාලකයන්ගේ අපේක්ෂාව විය හැකිය.

තමන් ජීවත් වන නිවසට ස්ථිර ලිපිනයක් තිබීමේ මූලික සිවිල් අයිතිවාසිකම වතුකරයේ ජීවත් වන ජනතාවට අහිමි කර ඇත.

ඔවුන්ට ඇත්තේ වත්තේ ලැයිමේ ලිපිනයයි. වීදිවල නම වෙනුවට ඇත්තේ වත්තේ නම සහ පහළ කොටස හෝ උඩහ කොටස යන්නයි. මෙය ඉතා විශාල කලාපයකි. එකම නම් ඇත්තේ බහුල වෙත්.

අවාසනාව වී ඇත්තේ වතු දෙමළ ජනතාවගේ ඡන්දයෙන් ව්‍යවස්ථාදායකය නියෝජනය කරන නායකයන් ද මේ සම්බන්ධයෙන් මුනිවත රැකීම ය.

ස්ථිර ලිපිනයන් ලැබීම වීදි නාම පුවරු සකස් කිරීම සහ නිවසේ ලිපිනය මුද්‍රණය කරන ලද කුඩා පුවරු බිත්තිවල ඇලවීම, වතු ලැයිම්වල ජීවත්වන ජනතාවට සන්තෘෂ්ටිජනක අත්දැකීමක් විය. ඔවුහු ඉතා උනන්දුවෙන් එම කටයුතුවල නියැළුණ හ.

මේ මහඟු අවස්ථාව මුළු වතුකරයේම ජනතාවට ලැබේවා යනු ඔවුන්ගේ පැතුම ය.